**දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2020**

**------------------------------------------------------------------**

දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ සැලැස්ම) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිලෝ මීටර් 33 ක් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම තුලින් ජාතික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248 කට සමාන එජඩො මිලියන 95 ක් වන අතර, ඉන් රු.මිලියන 9,025 කට සමාන එජඩො මිලියන 70 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වන රු. මිලියන 3,223 කට සමාන එජඩො මිලියන 25ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 තෙක් ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකියයුතු අඩුපාඩු ද ඇතුළුව සැලකියයුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මහ බැංකු විශේෂ (ඩොලර්) ගිණුමේ රු. මිලියන 13.22 ක් වූ විනිමය ලාභය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රතිපත්ති අංක 05 හි දක්වා ඇති විධිවිධාන වලට පටහැනි වන ආකාරයෙන් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි වැරදි ලෙස බැරට දක්වා තිබුණි. | 13.22 | මෙම විනිමය ලාභය 2021 වර්ෂයේදී ශුද්ධ වත්කම් යටතේ සටහන් කිරීමට හඳුනා ගන්නා ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රතිපත්ති අංක 05 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.3.1 වගන්තිය සහ 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2002 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ චක්‍රලේඛ ප්‍රකාරව අදාළ කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය ඇස්තමේන්තුවේ නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව කොන්ත්‍රාත්කරුට පැවරිය යුතුය. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් පැකේජ 2හි වටිනාකම රු. මිලියන 826 ක්වූ 193 වන වැඩ අයිතමය සඳහා සම්පූර්ණයෙන්ම සම්බන්ධ වී නොතිබුණු අතර රු. මිලියන 168 ක් වූ 68 වන වැඩ අයිතමයෙහි වැඩ කොටසක් සඳහා පමණක් සම්බන්ධ වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරු විසින් සිදු නොකරන ලද වැඩ කොටස් සඳහා රු. මිලියන 149 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකරම වැඩියෙන් ජ දරා තිබුණි. | ලංසු ඉදිරිපත් කරන විට සකස් කරන ලද වැඩ විෂය, ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී නව අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයෙන් වෙනස් කිරීමට සිදු වී ඇත. මුළු පිරිවැය ඇස්තමේන්තුව කොන්ත්‍රාත් මිලෙන් වෙනස්වීම සඳහා මෙම හේතුව බලපාන ලදී. | ප්‍රමාණ බිල්පත් පිළියෙළ කිරීමට ප්‍රථම සවිස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයක් සිදු කළ යුතු අතර ඉදිකිරීම් සම්බන්ධයෙන් නිවැරදි විෂය පථයක් හඳුනා ගත යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8.13.4 ජේදය | කොන්ත්‍රාත් පැකේජ 2හි මුළු පිරිවැය වූ රු. මිලියන 3,064 ක් වූ අතර ඉන් සියයට 20ක් නියෝජනය කරන රු. මිලියන 510 ක් පසුකාලීනව සිදුවිය හැකි | මෙම ගෙවීම් සිදු කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8.13.4 ජේදය ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය | ගෙවීම් සිදු කිරීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | |
|---|---|---|
| වෙනස්කම් සඳහා හදිසි අවස්ථා ප්‍රතිපාදන ලෙස සපයා තිබුණි. කෙසේවුවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8.13.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අපේක්ෂා කරන අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම් වල පසුකාලීන විෂය පථය වෙනස් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙන් සියයට 51 ක් ප්‍රමාණයක් එනම් රු. මිලියන 1,573 ක වටිනාකමක් සඳහා වෙනස්කම් සිදු කර තිබුණි. | ලබා ගෙන ඇත. | සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතරම අදාළ අධිකාරීන්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | 2020 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගත් කාර්ය සාධනය | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| (අ) | අඹතලේ සිනෙක් මංසන්දිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු | 100% | 99% | කොන්ත්‍රාත්තුව දින 483 කින් ප්‍රමාද වී ඇත. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. |
| (ආ) | කිරුලපන සිට ගොඩගම සහ පාමංකඩ සිට පොකුණුවිට දක්වා තෝරාගත් මාර්ග කොටස් ඉදිකිරීම | | | අත්පත් කර ගත් කාර්ය සාධන ප්‍රගතිය අපේක්ෂිත කාර්ය සාධන ප්‍රගතියට වඩා පසුගාමී වී ඇත. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. |
| | - මුල් වැඩසටහන ප්‍රකාරව | 68% | 21% | | |
| | - සංශෝධනය කරන ලද වැඩසටහන ප්‍රකාරව | 44% | 44% | | |

**කළමණාකරණයේ ප්‍රතිචාර** කාර්ය සාධනය වැඩි කිරීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් වැඩ කළ හැකි දින ගණන අඩු වී ඇත.

**විගණකගේ නිර්දේශ** ඉලක්ක ගත දිනයන්හිදී වැඩ නිම කිරීම සඳහා මාර්ග පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| කොන්ත්‍රාත්තුවේ අතිරේක පිරිවැය සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන්, 2020 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 248.6 ක් වූ කොන්ත්‍රාත්කරුවන්ගේ අවසාන ගෙවීම් සහතික වටිනාකම සහ වසර 1 ½ ක කාලයක් තිස්සේ තව දුරටත් ගෙවිය යුතුව පවතින වගකීම් පියවීමට ද ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් පියවීමේ ප්‍රමාදය ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට බලපා ඇත. | වටිනාකම රු. 2,279,809,993.98 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 03 ඉංජිනේරු විසින් සහතික කර අතුරු ගෙවීම් සහතික අංක 29 සමඟ ඉදිරිපත් කර ඇත. රු. 248,604,443.25 ක වටිනාකම ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පොළී පිරිවැය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාදයකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් පියවා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3. ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී ඇති තොරතුරු අනුව, රජයට අයත් ඉඩම් කැබලි 548 ක් ඇතුලුව ඉඩම් කැබලි 3,558 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය ලෙස රු. මිලියන 9,500 ක් වැය කර තිබුණි. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටු වල තීරණ යටතේ රු. මිලියන 5,243 ක අතිරේක ගෙවීම් සිදු කර තිබුණි. මීට අමතරව, 2020 දෙසැම්බර් 31 දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොළී වශයෙන් රු. මිලියන 289 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ කිසිදු ඉඩමක් ලියාපදිංචි කර ගෙන නොතිබුණි. | අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව ඉතිරි ඉඩම් කට්ටි සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීමට පෙර අත්පත් කරගත් ඉඩම් සඳහා නියමිත පොළී ගෙවීම් සම්පූර්ණයෙන් පියවිය යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ඉතිරි කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් පියවර ගත යුතු අතර, ඉඩම් වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වේ. |